# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-12-21 |

පැමිණිලි පාර්ශවය : ආර්.පී. සිරිමා මිය,
එච්.එස්. වීරසිංහ මිය,
338/ඩී, සමූපකාර මාවත,
නවගමුව දකුණ, රනාල.

වගඋත්තර පාර්ශවය : ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/74/18**

**පැමිණිල්ලේ කරුණු සැළ කිරීම =:**

ඉහත පැමිණිලිකාරිය විසින් 2018-01-10 දාතමින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් ගුරු සේවයේ යෙදී සිට විශ්‍රාම ගොස් සිටින බවත්, ගුරු සේවයේ I පන්තියට පිවිසීමේදී තරග විභාගයකින් සමත්ව තමන් එම කඩඉමට පැමිණි බවත්, 1994 බඳවා ගැනීමේ ගැසට් නිවේදනය පරිදි සුදුසුකම් සපුරා I පන්තියට පැමිණ සිටි බවත්, ගුරු සේවයේ I පන්තියේ බඳවා ගැනීමේ පැරණි ගුරු සේවා ව්‍යවස්ථාව අනුව I වෙනි පන්තියේ විභාගය සම්බන්ධයෙන් වැටුප් පියවරට එම ව්‍යවස්ථාව අනුව M.ed උපාධිධාරීන්ද ඉහත තමන් සමත් විභාගයට පෙනී සිටීම සිදු නොකර පැමිණි බවත්, ඒ අනුව මෙම කණ්ඩායම් දෙකම 2012 වසර දක්වා සමාන වැටුප් පියවරයන්හි පසුවූ බවත්ය.

මේ අතර 2012 වසරේ සකස් කරන ලද නව ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව තමන් හා සමාන තත්වයක සිටි M.ed උපාධිධාරීන්ට තමන්ට වඩා වැටුප් වර්ධක දෙකක් ලබාදී තමන්ට එම වැටුප් වර්ධක දෙක ලබා නොදීම හේතුවෙන් සමානයින් අතර අසමාන සැලකිල්ලට භාජනය කර ඇති බවත්, මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර ඇතත්, පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාව දක්වා මෙම විෂමතාවය ඉවත් කර දී නොමැති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. මේ හේතුවෙන් දැනට විශ්‍රාම ගොස් සිටින තමන් ඇතුළු පිරිසකගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර සහන සලසා දෙන ලෙස පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. සභාපති / தவிசாளர் } 011-2505451 ෆැක්ස් / தொலைநகல் } 011-2505541/ 74 ඊමේල් / மின்னஞ்சல் } sechrcsl@gmail.com

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැලකිරීම =:**

අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම පැමිණිල්ලට අදාලව පැවැති 2018.11.29 දිනැති පරීක්ෂණයේදී කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලි පාර්ශවයේ වැටුප් වර්ධක ගැටළුව සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇති බවත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමගද සාකච්ඡා කර මසක් ඇතුලත පිලිතුරක් ලබාදීමට හැකියාව ඇති බවත්ය.

කෙසේ වෙතත් 2019-12-20 දිනැති පරීක්ෂණ දිනය තෙක්ම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාලව පැමිණිලිකරුවන්ට සහනයක් සලසාදීම සම්බන්ධයෙන් නිශ්චිත පිලිතුරක් ලබාදීමට වගඋත්තරකාර පාර්ශවය අසමත් වී ඇති බව නිරීක්ෂණය වේ. තවද මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයේදී ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ද වගඋත්තරකරුවෙකු ලෙස කැඳවා ඇති අතර, ඊට සහභාගි වී ඇති නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ විසින් සඳහන් කර ඇත්තේ, මෙම ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් තම අවධානය යොමු කර ඇති බවත්, ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානයටද මෙම ගැටළුව යොමු කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව ඉදිරියේදී මෙම පැමිණිලිකරුවන්ට සහනයක් ලබාදීමට ඇති හැකියාව පිලිබඳව අවධානය යොමු කර තිබෙන බවත්ය. ඒ සඳහා අදාල ලිඛිත දැන්වීම් සිදුකර ඇති බවද ප්‍රකාශ කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය හා නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ලට අදාලව සිදුකර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී, මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණයට අදාල වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යාපන අමාත්‍යාංශය මේ දක්වා පැමිණිලිකරුවන්ට සහනයක් සලසාදීමට කටයුතු කර නොමැති අතර, පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවන ආකාරයෙන් තමන් කටයුතු කර නොමැති බවට ප්‍රකාශ කිරීමක්ද සිදුකර නොමැත. විශේෂයෙන්ම මෙම පැමිණිලිකරුවන් විශ්‍රාමික රජයේ සේවකයින් වන අතර, පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාව වනවිට ඔවුන් වයස අවුරුදු 68 පමණ වන බවද සඳහන් කර ඇත.

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට පැමිණිලිකාරියන් දෙදෙනාට හිමිකමක් ඇති බව ප්‍රකාශ කරන වැටුප් වර්ධක දෙකක ප්‍රමාණය ඔවුන් හා සම තත්වයේ සිටි බව ප්‍රකාශ කළ ගුරු සේවයේ තවත් එවැනි පිරිසකට ලබාදී තිබීම සහ මෙම පැමිණිලිකාරියන් දෙදෙනා ඇතුළු ගුරු සේවයේ I වන පන්තියේ සිටි සමාන තත්වයේ ගුරු පිරිසකට ලබා නොදීම සමානයින්ට අසමානව සැලකීමක් බව නිරීක්ෂණය වේ.

ඉහත නිරීක්ෂණය අනුව මෙම පැමිණිල්ලට අදාලව සිදුකර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති පරිදි වගඋත්තරකාර පාර්ශවය ලෙස පැමිණිල්ල මගින් නම් කර ඇති ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අදාල අනෙකුත් වගකිවයුතු නිලධාරීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් පැමිණිලිකාරියන් සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකාරියන් දෙදෙනා වෙත 2012 වර්ෂයේ සිට ලබා දියයුතු වැටුප් වර්ධක ගණනය කර ලබාදී ඔවුන්ට බලපා තිබෙන වැටුප් විෂමතාවය ඉවත් කර නියමිත විශ්‍රාම වැටුපෙහි පිහිටුවන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmugan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය බත්තරමුල්ල.

B/